# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2005 අංක 31 දරන කප්රුක අරමුදල පනත

---

[සහතිකය සටහන් කලේ 2005 සැප්තැම්බර් මස 22 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2005 සැප්තැම්බර් මස 23 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ **II** වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිල :** රු. **13.50** යි. තැපැල් ගාස්තුව **:** රු. **7.50** යි.

# 2005 අංක 31 දරන කප්රුක අරමුදල පනත

[සහතිකය සටහන් කළේ 2005 සැප්තැම්බර් මස 22 වැනි දින]

එල්. ඩී.–ඕ. 60/2004.

"කප්රුක අරමුදල" යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් පිහිටුවීම පිණිස විධිවිධාන සැලැස්වීම සඳහා ද, එකී අරමුදලේ පරමාර්ථ හා බලතල නිශ්චිතව දැක්වීම සඳහා ද, කප්රුක සමිති ලියාපදිංචි කිරීම සඳහා ද, ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම සඳහා ද වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2005 අංක 31 දරන කප්රුක අරමුදල පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

## I වන කොටස

## කප්රුක අරමුදල පිහිටුවීම

2. (1) (මෙහි මින් මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) කප්රුක අරමුදල නම් වූ අරමුදලක් පිහිටුවනු ලැබිය යුතු ය. කප්රුක අරමුදල පිහිටුවීම.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තියෙන් අරමුදලට නියම කර ඇති නාමයෙන් ඒ අරමුදල අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් විය යුතු අතර, ඒ නාමයෙන් අරමුදල විසින් ද, අරමුදලට විරුද්ධව ද, නඩු පවරනු ලැබිය හැකි ය.

3. (1) අරමුදලේ පරිපාලනය, කළමනාකරණය සහ පාලනය මෙහි මින් මතු විධිවිධාන සලසා ඇති පරිදි සංස්ථාපනය කරනු ලබන කළමනාකරණ මණ්ඩලයක් වෙත පවරනු ලැබිය හැකි ය. අරමුදලේ කළමනාකාර මණ්ඩලයේ සංයුතිය.

(2) (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) අරමුදලේ කළමනාකරණ මණ්ඩලය පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය :—

(අ) පොල් වගාකිරීමේ මණ්ඩලයේ සභාපතිවරයා ;

(ආ) පොල් සංවර්ධන අධිකාරියේ සභාපතිවරයා ;

(ඇ) පොල් පර්යේෂණ මණ්ඩලයේ සභාපතිවරයා ;

(ඈ) පොල් වගාකිරීමේ මණ්ඩලයේ සාමාන්‍යාධිකාරිවරයා, පොල් සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා, පොල් පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂවරයා ;

(ඉ) වැවිලි කර්මාන්ත විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ අතිරේක ලේකම් තනතුරට අඩුනොවූ තනතුරක් දරන අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන නිලධරයකු ;

(ඊ) පොල් කර්මාන්තයේ විශිෂ්ටත්වයක් ලබා ඇති තැනැත්තන් අතුරින්, අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් දෙදෙනකු;

(උ) ජාතික කප්රුක සමිති සම්මේලනයේ සභාපතිවරයා සහ එම සම්මේලනය විසින් නම් කරනු ලබන නියෝජිතයන් සිවුදෙනකු.

මණ්ඩලයේ සභාපතිවරයා.

**4**. (1) පොල් වගාකිරීමේ මණ්ඩලයේ සභාපතිවරයා නිල බලයෙන් කළමනාකරණ මණ්ඩලයේ සභාපතිවරයා වශයෙන් පත්වනු ලැබේ.

(2) 5 වන වගන්තියේ (ආ) ඡේදයේ විධිවිධානවලට යටත්ව, මණ්ඩලයේ සභාපතිවරයාගේ ධුර කාලය ඔහු පොල් වගාකිරීමේ මණ්ඩලයේ සභාපති ධුරය දරන කාලසීමාව විය යුතු ය.

(3) මණ්ඩලයේ මුළු සාමාජික සංඛ්‍යාව 14 ක් විය යුතු ය.

සභාපතිවරයා සහ සාමාජිකයන් ධුරයෙන් ඉල්ලා අස්වීම සහ ධුරයෙන් ඉවත් කිරීම.

**5**. (අ) මණ්ඩලයේ සභාපතිවරයාට හෝ 3 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඉ) සහ (උ) ඡේද යටතේ පත් කරනු ලබන සාමාජිකයකුට, තත්කාර්ය සඳහා අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(ආ) අමාත්‍යවරයා විසින්, මණ්ඩලයේ සභාපතිවරයා හෝ යම් සාමාජිකයකු, හේතු දක්වා එම සභාපති හෝ සාමාජික ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

අරමුදලේ සාමාජිකත්වය.

**6**. මේ පනත යටතේ ලියාපදිංචි වූ කප්රුක සමිතිවල සාමාජිකයන් සහ නිලධරයන් අරමුදලේ සාමාජිකත්වයට හිමිකම් ලැබිය යුතු ය.

මණ්ඩලයේ රැස්වීම්.

**7**. (1) මණ්ඩලයේ සභාපතිවරයා මණ්ඩලයේ සෑම රැස්වීමක දී ම මුලසුන දැරිය යුතු ය. මණ්ඩලයේ යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොසිටි අවස්ථාවක, පැමිණ සිටින සාමාජිකයන් අතුරින් තෝරා පත් කර ගනු ලබන යම් සාමාජිකයෙක් ඒ රැස්වීමේ මුලසුන දැරිය යුතු ය.

(2) මණ්ඩලයේ යම් රැස්වීමක ගණපූරණය 3 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (අ), (ආ) සහ (ඇ) ඡේදවල සඳහන් කර ඇති සාමාජිකයන් සහ (ඉ) ඡේදයේ සඳහන් කර ඇති සාමාජිකයන්ගෙන් එක් අයෙක් ද ඇතුළුව සාමාජිකයන් හත් දෙනෙක් විය යුතු ය.

(3) මේ වගන්තියේ (1) වන හා (2) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව, මණ්ඩලයේ රැස්වීම් සහ ඒ රැස්වීම්වල කටයුතු කර ගෙන යාම පිළිබඳ කාර්ය පටිපාටිය මණ්ඩලය විසින් විධිමත් කරනු ලැබිය හැකි ය.

සාමාජිකයන් අතර පුරප්පාඩුවක් තිබීම නිසා මණ්ඩලයේ යම් ක්‍රියාවක් හෝ කටයුත්තක් බලරහිත නොවිය යුතු බව.

**8**. මණ්ඩලයේ සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් තිබීමේ හෝ එහි සාමාජිකයකු පත් කිරීමෙහි ලා යම් දෝෂයක් තිබීමේ හෝ හේතුව නිසාම පමණක්, මණ්ඩලයේ කිසිදු ක්‍රියාවක් හෝ කටයුත්තක් බලරහිත ලෙස සලකනු නොලැබිය යුතු ය.

සාමාජිකයන්ගේ ධුර කාලය.

**9**. (1) (අ) 3 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඊ) ඡේදය යටතේ පත් කරන ලද සෑම සාමාජිකයකු ම කලින් ධුරයෙන් ඉවත් කරනු ලැබුව හොත් හෝ අන්‍යාකාරයකින් කලින් ධුරය හිස් කළහොත් මිස, තමා පත් කරනු ලැබූ දින සිට අවුරුදු තුනක කාලයක් සඳහා ධුරය දැරිය යුතු ය.

.(ආ) 3 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (උ) ඡේදය යටතේ පත් කරන ලද මණ්ඩලයේ සෑම සාමාජිකයකු ම කලින් ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් හෝ අන්‍යාකාරයකින් කලින් ධුරය හිස් කළහොත් මිස, තමා පත් කරනු ලැබූ දින සිට අවුරුදු එකක කාලයක් සඳහා හෝ නිලවරණයෙන් පසු නව නිලධාරීන් පත්වන තෙක් ධුරය දැරිය යුතු ය.

(2) නිල බලයෙන් පත් වූ මණ්ඩලයේ සෑම සාමාජිකයකු ම ඔහු මණ්ඩලයේ සාමාජිකයකු වන්නේ කුමන තනතුරක් ප්‍රකාරව ද, ඒ තනතුර දරන තාක් කල් ඔහු මණ්ඩලයේ සාමාජිකයකු ලෙස ධුරය දැරිය යුතු ය.

(3) 3 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඊ) හෝ (උ) ඡේදය යටතේ පත් කරනු ලැබූ සාමාජිකයකු, අමාත්‍යවරයා විසින් හේතු දක්වා ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් හෝ අමාත්‍යවරයා අමතනු ලබන ලිපියක් මගින් ඔහු තම ධුරයෙන් ඉල්ලා අස්වුවහොත් හෝ ඔහු ධුරය අත්හරින්නේ ය.

(4) 3 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඊ) හෝ (උ) ඡේදය යටතේ පත් කරනු ලැබීම නිසා ස්වකීය ධූරය හිස් කරනු ලැබූ අවස්ථාවක, අමාත්‍යවරයා විසින්, ඒ ඡේදවල විධිවිධාන සැලකිල්ලට ගෙන මණ්ඩලයේ යම් සාමාජිකයකු මිය යාම, ඉල්ලා අස්වීම, හෝ ධූරයෙන් ඉවත් කරනු ලැබූ සාමාජිකයා වෙනුවෙන් ක්‍රියා කිරීම සඳහා වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය යුතු ය. එසේ පත් කරනු ලැබූ තැනැත්තා විසින් ඔහුගේ ධූරයේ පූර්වගාමියාගේ ධූර කාලයෙන් ඉකුත් නොවී ශේෂ වී ඇති ධූර කාලය තුළ ධූරය දැරිය යුතු ය.

(5) ඉවත් කරනු ලැබීමෙන් හැර අන්‍යාකාරයකින් සිය ධූරය අත් හරින මණ්ඩලයේ යම් සාමාජිකයකු නැවත පත් කරනු ලැබීමට සුදුස්සකු විය යුතු ය.

(6) අසනීපවීම නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙනත් යම් හේතුවක් නිසා මණ්ඩලයේ සාමාජිකයකුට සිය ධූරයේ කර්තව්‍ය තාවකාලිකව ඉටු කිරීමට නොහැකිවන අවස්ථාවක, ඒ සාමාජිකයා වෙනුවට ක්‍රියා කිරීම සඳහා අමාත්‍යවරයා විසින් වෙනත් යම් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

අරමුදලේ මුද්‍රාව.

**10**. (1) අරමුදලට පොදු මුද්‍රාවක් තිබිය යුතු අතර, එය මණ්ඩලය විසින් කලින් කල තීරණය කරනු ලැබිය හැකි යම් තැනැත්තකු භාරයේ තිබිය යුතු ය.

(2) අරමුදලේ මුද්‍රාව මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් ආකාරයකට වෙනස් කරනු ලැබිය හැකි ය.

(3) අරමුදලේ මුද්‍රාව, මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී හැර කිසිම සාධන පත්‍රයකට හෝ ලේඛනයකට නොතැබිය යුතු අතර, ඒ සාමාජිකයන් දෙදෙනා විසින් තමන් පැමිණ සිට බවට සාක්ෂි වශයෙන් ඒ සාධන පත්‍රය හෝ ලේඛනය අත්සන් කරනු ලැබිය යුතු ය.

(4) අරමුදලේ මුද්‍රාව තබනු ලබන සාධන පත්‍රවල හා ලේඛනවල රෙජිස්ටරයක් මණ්ඩලය විසින් පවත්වා ගෙන යනු ලැබිය යුතු ය.

ගිවිසුම්වලට ඇති සම්බන්ධතාව සාමාජිකයන් විසින් අනාවරණය කළ යුතු බව.

**11**. මණ්ඩලය විසින් එළඹීමට යෝජිත ගිවිසුමකට කෙලින්ම හෝ අන්‍යාකාරයකින් සම්බන්ධතාවක් ඇති මණ්ඩලයේ සාමාජිකයකු විසින් ස්වකීය සම්බන්ධතාවයේ ස්වභාවය පිළිබඳ මණ්ඩලයේ රැස්වීමක දී අනාවරණය කළ යුතු ය. ඒ අනාවරණය කිරීම මණ්ඩලයේ වාර්තාවල සටහන් කරනු ලැබිය යුතු අතර, ඒ ගිවිසුම සම්බන්ධයෙන් මණ්ඩලය විසින් කරනු ලබන යම් සාකච්ඡාවකට හෝ ගනු ලබන යම් තීරණයකට ඒ සාමාජිකයා සහභාගි නොවිය යුතු ය.

**12**. මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි ආකාරයට සහ එවැනි අනු ප්‍රමාණ අනුව මණ්ඩලයේ සාමාජිකයනට පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු ය.

මණ්ඩලයේ සාමාජිකයන්ගේ පාරිශ්‍රමික.

## II වන කොටස

## අරමුදලේ පරමාර්ථ

**13**. පහත සඳහන් පරමාර්ථ අරමුදලේ පරමාර්ථ විය යුතු ය :—

අරමුදලේ පරමාර්ථ.

(අ) කුඩා පොල් වතු හිමියන්ට හා පොල් ආශ්‍රිත කුඩා කර්මාන්තකරුවන්ට සකසුරුවම්භාවය පුරුදු කිරීම හා ප්‍රවර්ධනය කිරීම සහ ඔවුන්ගේ සමාජ, ආර්ථික, සුබසාධන මට්ටම ඉහළ නැංවීම ;

(ආ) තම කුඩා පොල් වතුවල පොල් නිෂ්පාදනය හා කෘෂිකාර්මික ඵලදායිතාවය නංවාලීම පිණිස සහ අදාළ විද්‍යාත්මක තාක්ෂණය භාවිත කිරීම මගින් තම කුඩා පොල් වතුවලින් ලබන ප්‍රතිලාභ වැඩි කර ගැනීම පිණිස කුඩා පොල් වතු හිමියන්ට සහායවීම ;

(ඇ) පොල් ආශ්‍රිත සුළු කර්මාන්ත ඇරඹීම හා වැඩි දියුණු කිරීම්වලට අදාළ ආයෝජන ප්‍රවර්ධනය කිරීම ;

(ඈ) කුඩා පොල්වතුවල ඵලදාව නිමි භාණ්ඩ බවට පත් කිරීම සඳහා අවශ්‍ය පොල් පිරිසැකසුම් ඒකක, කර්මාන්ත ශාලා සහ වෙනත් පහසුකම් අත්කර ගැනීම, වැඩි දියුණු කර ගැනීම හෝ පිහිටුවීම ;

(ඉ) (මේ පනතේ “කප්රුක සමිති” යනුවෙන් සඳහන් කරනු ලබන) කුඩා පොල් වතු සංවර්ධන සමිති හා පොල් ආශ්‍රිත සුළු කර්මාන්ත සමිති ලියාපදිංචි කිරීම, විධිමත් කිරීම සහ අරමුදල වෙත ලියාපදිංචි වූ එහි සමිතිවලට ආධාර ලබා දීම ;

(ඊ) එවැනි පොල් පිරිසැකසුම් ඒකකවල හෝ කර්මාන්ත ශාලාවල නිෂ්පාදන අලෙවිය ප්‍රවර්ධනය කිරීම සහ වැඩිදියුණු කිරීම ;

(උ) කුඩා වතුවල පොල් නිෂ්පාදන කටයුතුවල හා පොල් නිෂ්පාදන සුළු කර්මාන්තවල යෙදී සිටින තැනැත්තන්ගේ දියුණුව සහ යහපත සඳහා අවශ්‍ය විය හැකි යම් පියවර ගැනීමට “ කප්රුක සමිති” වලට සහාය වීම.

මණ්ඩලයේ බලතල.

**14.** (1) අරමුදලේ පරමාර්ථ ක්‍රියාවට නැංවීම පිණිස අවශ්‍ය වන්නා වූ හෝ හිතකර වන්නා වූ හෝ ආනුෂංගික වන්නා වූ සියලු පියවර, අරමුදලේ නමින් ගැනීමට මණ්ඩලයට බලය ඇත්තේ ය.

(2) (1) වන උපවගන්තියෙන් පවරා දෙන ලද බලතලවල ව්‍යාප්තියට අගතියක් නොමැතිව මණ්ඩලයට පහත සඳහන් බලතල තිබිය යුතු ය :—

(අ) අරමුදලේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය විය හැකි සියලු ගිවිසුම් හා එකඟවීම්වලට කෙලින්ම හෝ මණ්ඩලය විසින් තත්කාර්ය සඳහා ලිඛිතව බලය දෙනු ලැබූ යම් නිලධරයකු හෝ අනුයෝජිතයකු මාර්ගයෙන් ඇතුල්වීම හා ඒවා ඉටු කිරීම ;

(ආ) අරමුදලේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය යම් භාණ්ඩයක්, උපකරණයක් හෝ යන්ත්‍රයක් මිල දී ගැනීම, ප්‍රවාහනය කිරීම, ගබඩා කිරීම, සැපයීම හා පවත්වාගෙන යාම;

(ඇ) අරමුදලේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය විය හැකි සියලුම නිලධරයන් සහ සේවකයන් පත් කිරීම, සේවයේ නියුක්ත කිරීම, වැටුප් ගෙවීම සහ විනය පරිපාලනය කිරීම ;

(ඈ) කුඩා පොල් වතු හිමියන්ගේ හා පොල් ආශ්‍රිත සුළු කර්මාන්තවල නියැලී සිටින්නන්ගේ යහපත උදෙසා විශ්‍රාම වැටුප් හෝ අර්ථ සාධක අරමුදල් පිහිටුවීම හා පවත්වාගෙන යාම සහ යම් අවදානම්වලට එරෙහිව අරමුදලේ සාමාජිකයන් රක්ෂණය කිරීම ;

(ඉ) අරමුදලේ සාමාජිකයන්, නිලධරයන් සහ සේවකයන් පුහුණු කිරීම ;

(ඊ) අරමුදලේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා බැංකු ගිණුම් විවෘත කිරීම, ක්‍රියාත්මක කිරීම සහ වසා දැමීම ;

(උ) අරමුදල විසින් ඉටු කරනු ලබන සේවා සඳහා හෝ සලසනු ලබන පහසුකම් හෝ උපකරණ සඳහා ගාස්තු හෝ වෙනත් අය කිරීම් අයකිරීම ;

(ඏ) ආර්ථික ප්‍රවර්ධනය සඳහා පොල් පිරිසැකසුම්, පොල් ආශ්‍රිත නිෂ්පාදන අලෙවි කිරීමේ යෙදී සිටින මේ පනත යටතේ ලියාපදිංචි කර ඇති යම් කප්රුක සමිතියකට ණය වශයෙන් හෝ ප්‍රදාන වශයෙන් මූල්‍ය ආධාර ඇතුළුව ආධාර ලබාදීම ;

(එ) අරමුදලේ කාර්ය සඳහා වහාම අවශ්‍ය නොවන අරමුදලේ මුදල් මණ්ඩලය විසින් යෝග්‍ය යයි සලකනු ලබන සුරැකුම්පත්වල ආයෝජනය කිරීම ;

(ඒ) (i) අරමුදලේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීම හෝ මණ්ඩලයේ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය විය හැකි යම් කාරණයකට අදාළ වූ සත්‍ය හා නිවැරදි වාර්තා, මණ්ඩලය විසින් නිශ්චිතවම දක්වනු ලැබිය හැකි ආකාරයෙන් සහ විස්තර ඇතුළත්ව තබා ගන්නා ලෙස යම් තැනැත්තකුට නියම කිරීම ;

(ii) අරමුදලේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා හෝ මණ්ඩලයේ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය විය හැකි යම් කරුණකට අදාළව යම් තැනැත්තකුගේ දැනුම අනුව ඔහු දන්නා සියලු වාර්තා, තොරතුරු සහ පැහැදිලි කිරීම් නිශ්චිතව දක්වනු ලැබිය හැකි කාලසීමාවක් ඇතුළත ඉදිරිපත් කරන ලෙස එම තැනැත්තාට නියම කිරීම ;

(iii) මේ ඡේදයේ (i) වන අනුඡේදය යටතේ පවත්වා ගෙන යනු ලැබූ යම් වාර්තාවක් හෝ (ii) වන අනුඡේදය යටතේ ඉදිරිපත් කරනු ලැබූ යම් වාර්තාවක, තොරතුරක හෝ පැහැදිලි කිරීමක සඳහන් යම් සිද්ධිමය කරුණක සත්‍ය අසත්‍යතාවය බැලීමේ කාර්යය සඳහා මණ්ඩලයට අවශ්‍ය විය හැකි යම් ලිඛිත හෝ වෙනත් සාක්ෂි නිශ්චිත දිනයකට පෙර ඉදිරිපත් කරන ලෙස හෝ ඉදිරිපත් කිරීමට කටයුතු සලස්වන ලෙස යම් තැනැත්තකුට නියම කිරීම ;

(iv) මේ ඡේදයේ (i) වන අනුඡේදය යටතේ පවත්වා ගෙන යාමට නියමිත වාර්තාවක් පරීක්ෂා කිරීමේ හා සත්‍යායනය කිරීමේ කාර්යය සඳහා මේ ඡේදයේ (ii) වන හෝ (iii) වන අනුඡේදය යටතේ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද යම් වාර්තාවක හෝ තොරතුරක හෝ පැහැදිලි කිරීමක අන්තර්ගත යම් තොරතුරු සත්‍යායනය කිරීමේ කාර්යය සඳහා හෝ තොග පරීක්ෂා

කිරීමේ හා නිවැරදිතාවය බැලීමේ කාර්යය සඳහා යම් සාධාරණ වේලාවක යම් ඉඩමකට, ගොඩනැගිල්ලකට, කාර්යාලයකට, ගබඩාවකට, කර්මාන්තශාලාවකට, මඩුවකට හෝ පරිශ්‍රයකට ඇතුළු වීම සහ පරීක්ෂා කිරීම.

(3) සාධාරණ හේතුවක් නොමැතිව (2) වන උපවගන්තියේ (ඒ) ඡේදයේ (i) වන අනුඡේදයේ හෝ (ii) වන අනුඡේදයේ හෝ (iii) වන අනුඡේදයේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින හෝ යම් අසත්‍ය වාර්තා දැන දැනම පවත්වා ගෙන යන හෝ යම් අසත්‍ය වාර්තා, අසත්‍ය තොරතුරු, අසත්‍ය පැහැදිලි කිරීම් හෝ අසත්‍ය ලිඛිත සාක්ෂි හෝ වෙනත් අසත්‍ය සාක්ෂි දැන දැනම ඉදිරිපත් කරන හෝ (2) වන උපවගන්තියේ (ඒ) ඡේදයේ (iv) වන අනුඡේදය මගින් මණ්ඩලය වෙත පවරා ඇති බලතල ක්‍රියාත්මක කිරීමේ දී මණ්ඩලයට අවහිර කරන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

## III වන කොටස

## කප්රුක සමිති

කප්රුක සමිතිවල සාමාජිකත්වය.

**15**. මේ පනත යටතේ ලියාපදිංචි කළ කප්රුක සමිතියක සාමාජිකත්වය ලබා ගැනීමට පහත සඳහන් තැනැත්තන් සුදුස්සන් විය යුතු වේ :—

(අ) වයස අවුරුදු දහඅටට නොඅඩු කුඩා පොල්වතු හිමියන් වූ එවැනි සමිතියක ක්‍රියාකාරී ප්‍රදේශයක් ඇතුළත පිහිටි පොල් ඉඩම් අයිතිකරුවන් සහ ;

(ආ) ඒ ප්‍රදේශය ඇතුළත අලුත් පොල් වගාවන් සඳහා අවසර පත්‍ර නිකුත් කරනු ලැබූ කුඩා පොල්වතු හිමියන් ; සහ

(ඇ) මෙම ප්‍රදේශය ඇතුළත දැනට පවත්වාගෙන යනු ලබන, අළුතින් ආරම්භ කරනු ලබන පොල් ආශ්‍රිත කුඩා කර්මාන්තකරුවන්.

කප්රුක සමිතිවල පරමාර්ථ.

**16**. මේ පනත යටතේ ලියාපදිංචි කළ සෑම කප්රුක සමිතියකම පරමාර්ථ වනුයේ —

(අ) සාමාජිකයන් අතර, අවබෝධය ඇති කිරීම සහ එය වැඩි දියුණු කිරීම ද, එසේම ස්වකීය නිෂ්පාදන සඳහා උපරිම ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා සහයෝගයෙන් ක්‍රියා කිරීම ;

(ආ) සිය සාමාජිකයන් අතර සකසුරුවම් භාවය ඇති කොට, එය ප්‍රවර්ධනය කිරීම සහ සාමාජිකයන්ගේ ආර්ථික හා සාමාජයීය තත්ත්වයන් ඉහළ නැංවීම ;

(ඇ) තම කුඩා පොල්වතුවල පොල් නිෂ්පාදනය සහ කෘෂිකාර්මික ඵලදාව නංවාලීම පිණිස සහ අදාළ විද්‍යාත්මක තාක්ෂණය භාවිත කිරීම මගින් තම කුඩා පොල් වතුවලින් ලබන ලාභ වැඩි කර ගැනීම පිණිස කුඩා පොල්වතු හිමියන්ට සහාය වීම ;

(ඈ) පොල් ආශ්‍රිත සුලු පරිමාණයේ කර්මාන්තයට අදාළ වූ යෝග්‍ය ආයෝජන ප්‍රවර්ධනය කිරීම ;

(ඉ) සමිතියේ සාමාජිකයන්ගේ නිෂ්පාදන සඳහා අවශ්‍ය පොල් පිරිසැකසීමේ ඒකක, කර්මාන්තශාලා සහ වෙනත් පහසුකම් අත්කර ගැනීම, සංවර්ධනය කිරීම සහ පිහිටුවීම ;

(ඊ) සමිතියේ සාමාජිකයන්ට මූල්‍ය හා වෙනත් ආධාර ලබා දීම ;

(උ) වටිනාකම එකතු කළ පොල් හා පොල් ආශ්‍රිත නිෂ්පාදන පදනම් කරගත් කර්මාන්ත උනන්දු කරවීම ;

(ඌ) එවැනි පොල් හා පොල් ආශ්‍රිත පිරිසැකසුම් ඒකකවල හෝ කර්මාන්තශාලාවල නිෂ්පාදන, අලෙවි කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ වර්ධනය කිරීම ; සහ

(එ) සමිතියේ සාමාජිකයන්ගේ අභිවෘද්ධිය සඳහා අවශ්‍ය විය හැකි පියවර ගැනීම.

කප්රුක සමිති ලියාපදිංචි කිරීම.

**17**. (1) කප්රුක සමිතියකට මේ පනත යටතේ ලියාපදිංචි කිරීම සඳහා නියෝග මගින් නියමිත ආකාරයට ඒ සඳහා නියමිත ගාස්තු සමඟ මණ්ඩලය වෙත ඉල්ලුම් කළ හැකි ය.

(2) මේ පනත යටතේ සහ මේ පනත යටතේ සාදන ලද නියෝග වලට අනුකූලව ලියාපදිංචි කරන ලද කප්රුක සමිතියක් මේ පනත යටතේ ලියාපදිංචි කරනු ලැබූ නාමයෙන් සංස්ථාවක් විය යුතු අතර, එයට අවිච්ඡින්න පැවැත්මක් තිබිය යුතු ය. තව ද, ඒ නාමයෙන් එය විසින් ද, එයට විරුද්ධව ද, නඩු පවරනු ලැබිය හැකි ය.

(3) මේ පනත යටතේ ලියාපදිංචි කරනු ලැබූ සෑම කප්රුක සමිතියකටම පොදු මුද්‍රාවක් තිබිය යුතු අතර, සමිතිය විසින් තීරණය කරනු ලැබිය හැකි යම් තැනැත්තකු භාරයේ එම මුද්‍රාව තිබිය යුතු ය.

(4) (අ) මේ පනත යටතේ කප්රුක සමිතියක් ලියාපදිංචි කළ විට නාමලේඛනයේ එම සමිතියට දී ඇති නාමයෙන් කප්රුක සමිතියක් ලියාපදිංචි කර ඇති බවට සඳහන් කරමින් සහ එම සමිතිය ලියාපදිංචි කරනු ලැබුයේ කවර දිනක සිට බලපැවැත්වෙන පරිදි ද යන්න සඳහන් කරන නිවේදනයක් ගැසට් පත්‍රයේ පළ කිරීමට මණ්ඩලය විසින් කටයුතු සැලැස්විය යුතු ය.

(ආ) ලියාපදිංචි කප්රුක සමිතියක ලියාපදිංචිය අවලංගු කිරීමේ දී එම සමිතියේ ලියාපදිංචිය අවලංගු කරනු ලැබ ඇති බවට සඳහන් කරන නිවේදනයක් ගැසට් පත්‍රයෙහි පළ කිරීමට මණ්ඩලය කටයුතු කළ යුතු ය.

## IV වන කොටස

## මුදල් හා කාර්ය මණ්ඩලය

අරමුදලට ගෙවීම්.

**18**. පහත සඳහන් මුදල් අරමුදලට ගෙවනු ලැබිය යුතු ය :—

(අ) අරමුදලේ ප්‍රයෝජනය සඳහා පාර්ලිමේන්තුව විසින් කලින් කල සම්මත කරනු ලැබිය හැකි සියලු මුදල් ;

(ආ) අරමුදලේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී සහ කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීමේ දී අරමුදලට ලැබෙන සියලු මුදල් ;

අරමුදලෙන් ගෙවීම.

**19**. පහත සඳහන් මුදල් අරමුදලෙන් ගෙවිය යුතු ය :—

(අ) අරමුදල ක්‍රියාත්මක කිරීමේ දී සහ පවත්වා ගෙන යාමේ දී මණ්ඩලය විසින් දරන ලද යම් වියදමක් ගෙවීම පිණිස අවශ්‍ය වන මුදල් ;

(ආ) අරමුදලේ පරමාර්ථ ඉටු කර ගැනීමේ කාර්ය සඳහා අවශ්‍ය බවට මණ්ඩලය විසින් අනුමත කර ඇති සියලු ගෙවීම් සහ අරමුදලින් ගෙවිය යුතු බවට මේ පනත මගින් නියම කරනු ලැබ ඇති සියලු ගෙවීම් ; සහ

(ඇ) මේ පනත ආරම්භවන දිනයේ දී බලාත්මකව පවතින කප්රුක සමිතිවල වගකීම් ඉටු කිරීම සඳහා අවශ්‍ය සියලු මුදල්.

**20**. මේ පනත ක්‍රියාත්මක වන දිනයේ දී කප්රුක සමිතිවලට අයත්ව තිබෙන සියලු නිශ්චල හෝ චංචල දේපළ එම දිනයේ සිට බලපැවැත්වෙන පරිදි අරමුදල සතු විය යුතු ය. වත්කම් අත්කර ගැනීම.

**21**. (1) මණ්ඩලය විසින් අරමුදලේ ආදායම් හා වියදම්, වත්කම් හා බැරකම් සහ අරමුදලේ වෙනත් සියලු ගණුදෙනු පිළිබඳව නිසි ගිණුම් පොත් තබා ගැනීමට සැලැස්විය යුතු ය. ගිණුම් හා විගණනය.

(2) රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය කිරීමට අදාළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන අරමුදලේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(3) යෝජනා සම්මතයක් මගින් මණ්ඩලය විසින් තත්කාර්ය සඳහා බලය දෙන ලද මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනකු විසින් මණ්ඩලයේ ආදායම් හා වියදම් හා ශේෂ පත්‍රය අත්සන් කරනු ලැබිය යුතු ය.

**22**. අරමුදලේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය. මුදල් වර්ෂය.

**23**. (1) මණ්ඩලයේ ඉල්ලීම මත, රජයේ සේවයේ නියුක්ත යම් නිලධරයකු ඒ නිලධරයාගේ, ඒ නිලධරයා සේවයේ නියුක්ත යම් අමාත්‍යාංශයක් යටතේ ද ඒ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ හා රාජ්‍ය පරිපාලන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ කැමැත්ත ඇතිව, මණ්ඩලය විසින් තීරණය කල හැකි කාල පරිච්ඡේදයක් සඳහා අරමුදලේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය ; නැතහොත් එවැනිම කැමැත්ත ඇතිව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කිරීම හෝ කරනු ලැබිය හැකි ය. අරමුදලේ කාර්ය මණ්ඩලයට රජයේ නිලධරයන් පත් කිරීම.

(2) අරමුදලේ කාර්ය මණ්ඩලයට රජයේ යම් නිලධරයකු තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ඔහුට හා ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(3) රජයේ සේවයේ යම් නිලධරයකු අරමුදලේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබූ අවස්ථාවක 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ඔහුට හා ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(4) යම් නිශ්චිත කාල පරිච්ඡේදයක් ආණ්ඩුවට සේවය කරන බවට එකඟ වෙමින් ආණ්ඩුව සමග ගිවිසුමකට එළඹ ඇති යම් තැනැත්තකු මණ්ඩලය විසින් සේවයේ නියුක්ත කරනු ලබන අවස්ථාවක, ඒ තැනැත්තා විසින් අරමුදලට සේවය කරනු ලබන යම් කාලපරිච්ඡේදයක් ඒ ගිවිසුමේ වගකීම ඉටු කිරීමේ කාර්ය සඳහා ආණ්ඩුවට සේවය කරන ලද කාල පරිච්ඡේදයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

V වන කොටස

**සාමාන්‍ය කරුණු**

මණ්ඩලයේ බලතල පැවරීම.

**24**. (1) මණ්ඩලයේ බලතලවලින් යම් බලතලයක් මණ්ඩලය විසින් මණ්ඩලයේ යම් සාමාජිකයකු වෙත හෝ අරමුදලේ යම් නිලධරයකු වෙත හෝ සේවකයකු වෙත පවරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් බලතලයක් තමා වෙත පවරනු ලැබූ සෑම සාමාජිකයකුම හෝ නිලධරයකුම හෝ සේවකයකුම මණ්ඩලයේ විධානවලට හා පාලනයට යටත්ව එම බලතල ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

මණ්ඩලය අමාත්‍යවරයාගේ විධානවලට යටත් විය යුතු බව.

**25**. මණ්ඩලයේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී හා කාර්ය ඉටු කිරීමේ දී මණ්ඩලය අමාත්‍යවරයා විසින් දෙනු ලබන සාමාන්‍ය හෝ විශේෂ විධානවලට යටත් විය යුතු ය.

මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය අනුව කෙරෙන ක්‍රියා සඳහා ආරක්ෂාව.

**26**. (1) (අ) මණ්ඩලය විසින් මේ පනත යටතේ සද්භාවයෙන් කරනු ලබන යම් නෛතික ක්‍රියාවක් සම්බන්ධයෙන් මණ්ඩලයට එරෙහිව හෝ ;

(ආ) මණ්ඩලයේ යම් සාමාජිකයකු හෝ අනුයෝජිතයකු හෝ අරමුදලේ යම් නිලධරයකු හෝ සේවකයකු විසින් සද්භාවයෙන් මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය අනුව කරනු ලබන යම් නෛතික ක්‍රියාවක් වෙනුවෙන් ඔහුට විරුද්ධව,

කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

(2) යම් අධිකරණයක් ඉදිරියේ මණ්ඩලය විසින් හෝ මණ්ඩලයට විරුද්ධව පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක් වෙනුවෙන් මණ්ඩලයට දැරීමට සිදුවන වියදම් අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර, ඒ සිවිල් හෝ අපරාධ නඩුවක දී මණ්ඩලයට ගෙවනු ලබන හෝ මණ්ඩලය විසින් අය කර ගනු ලබන නඩු ගාස්තු ඇත්නම්, ඒවා අරමුදලට බැර කළ යුතු ය.

(3) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධාන යටතේ කරනු ලබන යම් ක්‍රියාවක් වෙනුවෙන් යම් අධිකරණයක් ඉදිරියේ පවරනු ලබන යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී, ඒ වියදම් ඒ ක්‍රියාව සද්භාවයෙන් කරන ලද බවට අධිකරණය තීරණය කරන්නේ නම්, ඒ නඩුවේදී ඔහු විසින් දරන ලද යම් වියදමක් අරමුදලින් අත්තිකාරම් කරනු ලැබ ඇත්තේ නම් හෝ ඔහු විසින් ඒ සිවිල් හෝ අපරාධ නඩුවේ දී අය කර ගන්නේ නම් මිස, අරමුදලින් ගෙවිය යුතු ය.

**27**. මණ්ඩලයට විරුද්ධව ගෙනෙන ලද යම් නඩුවක දී මණ්ඩලයේ යම් සාමාජිකයකුට විරුද්ධව පෞද්ගලිකව නැතහොත් ඔහුගේ දේපළ විෂයයෙහි රිට් ආඥාවක් නිකුත් නොකරනු ලැබිය යුතු ය. මණ්ඩලයේ සාමාජිකයකුට විරුද්ධව පෞද්ගලිකව හෝ දේපළ විෂයයෙහි රිට් ආඥාවක් නිකුත් නොකළ යුතු බව.

**28**. මේ පනත යටතේ වූ යම් වරදක් සිදු කරන සෑම තැනැත්තකු ම මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පවත්වනු ලබන නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබීමේ දී මාස හයක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් දස දහසක් නොඉක්මවන දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දඬුවම් දෙකටම යටත් විය යුතු ය. දණ්ඩන.

**29**. මණ්ඩලයේ සියලුම සාමාජිකයන් සහ අරමුදලේ නිලධරයන් හා සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයේ කාර්ය සඳහා එහි අර්ථානුකූලව රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය. මණ්ඩලයේ සාමාජිකයන් හා අරමුදලේ නිලධරයන් හා සේවකයන් රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු බව.

**30**. අරමුදල අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, එම පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගත යුතු ය. අරමුදල උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු බව.

නියෝග.

**31**. (1) නියෝග සෑදීමට මෙම පනතින් බලය දෙනු ලැබූ යම් කාරණයක් සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියෙන් පවරන ලද බලතලවල ව්‍යාප්තියට අගතියක් නොවන පරිදි පහත දැක්වෙන සියලු කාරණා හෝ යම් කාරණයක් සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය :—

(අ) අරමුදලේ කටයුතු පරිපාලනය කිරීම හා මූල්‍ය කාර්ය පටිපාටි ;

(ආ) කප්රුක සමිති ලියාපදිංචි කළ යුතු කොන්දේසි ;

(ඇ) ලියාපදිංචි සමිති සහ එම සමිතිවල විධායක කමිටු සඳහා අතුරු ව්‍යවස්ථා සෑදීම ;

(ඈ) කප්රුක සමිතිවල ලියාපදිංචිය අවලංගු කිරීම ;

(ඉ) එම සමිතිවල සහ එහි විධායක කමිටුවල රැස්වීම් ;

(ඊ) ආරවුල් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරුවන් පත් කිරීම හා බේරුම් කිරීමේ කාර්ය පටිපාටිය ;

(උ) ඇවර කිරීමේ කාර්ය පටිපාටිය සහ ඇවරකරුවන්ගේ බලතල ;

(ඌ) නියෝග සාදනු ලැබීම සඳහා නියම කරනු ලැබිය හැක්කේ යම් කාරණා සම්බන්ධයෙන් ද ඒ කාරණා.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය. එය පළ කරනු ලැබූ දින සිට හෝ ඒ නියෝගයේ සඳහන් යම් පසු දිනක සිට හෝ එය ක්‍රියාත්මක විය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මණින් අනුමැතිය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් අගතියක් නොවන පරිදි ඒ අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබුවා සේ සලකනු ලැබිය යුතු ය.

(5) අමාත්‍යවරයා විසින් සාදන ලද යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සැලකෙන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය.

**32**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**33**. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි—

අර්ථ නිරූපණය.

"පොල් සහ පොල් ආශ්‍රිත සුළු කර්මාන්ත" යන්නෙන්, ගෘහස්ථ මට්ටමේ සුළු පරිමාණ හා අවිධිමත් ලෙස ක්‍රියාත්මක නිෂ්පාදන ඒකක අදහස් වේ ;

"පොල් වගාකිරීමේ මණ්ඩලය" යන්නෙන්, 1971 අංක 46 දරන පොල් සංවර්ධන පනතේ 2 වන වගන්තියෙන් පිහිටුවන ලද පොල් වගාකිරීමේ මණ්ඩලය අදහස් වේ ;

"පොල් සංවර්ධන අධිකාරිය" යන්නෙන් 1971 අංක 46 දරන පොල් සංවර්ධන පනතේ 24 වන වගන්තියෙන් පිහිටුවන ලද පොල් සංවර්ධන අධිකාරිය අදහස් වේ ;

"පොල් පර්යේෂණ මණ්ඩලය" යන්නෙන්, පොල් පර්යේෂණ ආඥාපනතින් පිහිටුවන ලද පොල් පර්යේෂණ මණ්ඩලය අදහස් වේ ;

"පොල් පර්යේෂණ ආයතනය" යන්නෙන්, පොල් පර්යේෂණ ආඥාපනතේ 2 වන වගන්තිය යටතේ පිහිටුවන ලද පොල් පර්යේෂණ ආයතනය අදහස් වේ ;

"කුඩා පොල් වතු" යන්නෙන්, ප්‍රමාණයෙන් අක්කර පනහක හෝ පනහකට වඩා අඩු වූ ඉඩම් ප්‍රමාණයක් අදහස් වන අතර, "කුඩා පොල් වතු හිමියා" යන යෙදුම ඒ අනුව තේරුම් ගත යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.